# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2251/10 – 2021 ඔක්තෝබර් මස 25 වැනි සඳුදා – 2021.10.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිවිනිපලාත කෝරළේ සුළු කොට්ඨාසයේ, කුරුකුදේ (57 සී) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුරුකුදේ (අ.ග.පි. 14) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක B/HLE/2019/495 හා 2019.12.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. කැබලි අක්ෂර **‘A’** – දඩුගලේ වත්ත – ප්‍රමාණය: **හෙක්. 0.5467 ක් පමණ**

උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ කහදගේ පෝල් පීරිස් සිල්වා සහ කහදගේ ඇන්තනී සිල්වා හිමිකම් කියන දඩුගලේවත්ත; නැගෙනහිරට: කහදගේ පෝල් පීරිස් සිල්වා සහ කහදගේ ඇන්තනී සිල්වා හිමිකම් කියන දඩුගලේවත්ත; දකුණට: කැබලි අක්ෂර B සහ විජේකෝන් මුදියන්සේලාගේ කපිල කුමාර හිමිකම් කියන දඩුගලේවත්ත; බටහිරට: කැබලි අක්ෂර B, විජේකෝන් මුදියන්සේලාගේ කපිල කුමාර හිමිකම් කියන දඩුගලේවත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා).

02. කැබලි අක්ෂර **‘B’** – දඩුගලේ වත්ත – ප්‍රමාණය: **හෙක්. 0.8026 ක් පමණ**

උතුරට: රත්නායක මුදියන්සේලාගේ රණවීර, දිසානායක මුදියන්සේලාගේ දිසානායක, විජේකෝන් මුදියන්සේලාගේ කපිල කුමාර හිමිකම් කියන දඩුගලේවත්ත, කැබලි අක්ෂර A සහ කහදගේ පෝල් පීරිස් සිල්වා, කහදගේ ඇන්තනී සිල්වා, විජේකෝන් මුදියන්සේලාගේ කරුනාසේන හිමිකම් කියන දඩුගලේවත්ත; නැගෙනහිරට: කැබලි අක්ෂර A, කහදගේ පෝල් පීරිස් සිල්වා, කහදගේ ඇන්තනී සිල්වා, විජේකෝන් මුදියන්සේලාගේ කරුනාසේන හිමිකම් කියන දඩුගලේවත්ත, කඳුර සහ රත්නායක මුදියන්සේලාගේ රණවීර හිමිකම් කියන දඩුගලේවත්ත; දකුණට: කඳුර සහ රත්නායක මුදියන්සේලාගේ රණවීර හිමිකම් කියන දඩුගලේවත්ත; බටහිරට: රත්නායක මුදියන්සේලාගේ රණවීර, දිසානායක මුදියන්සේලාගේ දිසානායක, විජේකෝන් මුදියන්සේලාගේ කපිල කුමාර හිමිකම් කියන දඩුගලේවත්ත.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/12/2018/WS/359.
2021 අප්‍රේල් මස 22 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 – 104